# පුස්තකාල භාවිතයෙහිලා පාඨක අධ්‍යාපනයෙහි (user education) වැදගත්කම සහ ක්‍රියාවලිය

ආර්. එච්. අයි. එස්. රණසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
කැළණිය විශ්වවිද්‍යාලය

පාඨක අධ්‍යාපනය යනු පුස්තකාල හෝ තොරතුරු මධ්‍යස්ථානවල ඇති සම්පත් හා සේවාවල භාවිතය සහ එමගින් උපරිම ප්‍රයෝජනය ගන්නා අන්දම පිළිබඳ පාඨකයාහට දැනුමක් ලබා දීමයි. පුස්තකාල හා විද්‍යාපන විද්‍යා ක්ෂේත්‍රයේ විසිවන සියවසේ වැදගත්කමක් ලත් සංකල්පයක් ලෙස පාඨක අධ්‍යාපනය හැඳින්විය හැක.

පැරණි යුගයේ පුස්තකාලයන්හි අරමුණ වූයේ පොත්පත් ආරක්ෂා කිරීමයි. මේ හේතුවෙන් පුස්තකාලයාධිපති පොත් භාරකරු වශයෙන් ද පුස්තකාලය පොත ගුල වශයෙන් ද හැඳින්විය. ක්‍රමයෙන් දැනුම වර්ධනය වීම හා මුද්‍රණ යන්ත්‍ර නිපදවීමත් සමගම නව දැනුම මුද්‍රණද්වාරයෙන් බිහි වීමට පටන් ගන්නා ලදී. මෙම දැනුම විවිධ අරමුණු සඳහා පුස්තකාල මාර්ගයෙන් බෙදා හැරීම සැම රටකම වැදගත් ප්‍රතිපත්තියක් විය. ඒ සමගම පුස්තකාල තොරතුරු මධ්‍යස්ථාන වශයෙන් දියුණු විය. පුස්තකාලවල ස්ථාපිත කරන නව දැනුම පාඨකයාට ලබා දීමට මග පෙන්වීම සඳහා පාඨක අධ්‍යාපනය යන විෂය සංකල්පය බිහි විය.

වර්තමාන යුගයේ පුස්තකාලයක ප්‍රධාන කාර්යය වනුයේ එහි තිබෙන සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට පාඨකයාට ඉඩ සලසා දීමයි. ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන ද, විවිධ මාධ්‍යයන් මගින් සීඝ්‍රයෙන් බිහිවන නව දැනුම ද නිසා සෑම පුස්තකාලයකට වුව ද ලබා ගත හැකි වනුයේ සීමිත සම්පත් ප්‍රමාණයක් පමණි. එහෙයින් පුස්තකාලයන් අතර සම්පත් හුවමාරුව (resource sharing) භාවිතයට පැමිණ ඇත. පාඨක අධ්‍යාපනයේ අරමුණ වනුයේ මේ සියලුම ආකාරයෙන් ලබා ගත හැකි සම්පත්වලින් පාඨකයාට උපරිම ප්‍රයෝජන ගැනීමට මං සලසාලීමයි.

## පාඨක අධ්‍යාපනයේ අවශ්‍යතාවය

විවිධ හේතූන් නිසා පාඨක අධ්‍යාපනයේ අවශ්‍යතාවය ඇති වුනි.

* පුස්තකාල සම්පත් වන පොත්, සඟරා, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් ඇදීය භාවිත නොකිරීම.
* තමන්ට අවශ්‍ය සම්පත් තෝරාගැනීමට දැනුමක් නොමැති වීම
* පුස්තකාල සම්පත් නිසියාකාරව භාවිත නොකිරීම.
* පුස්තකාල නීතිරීති සහ චර්යාධර්ම පිළි නොපැදීම
* පාඨකයා සහ පුස්තකාල කාර්ය මණ්ඩලය අතර ප්‍රමාණවත් සම්බන්ධතාවයක් නොවීම.

## පාඨක අධ්‍යාපනයේ අරමුණ

* පුස්තකාලයේ ඇති සම්පත් අදාළ සෑම පුද්ගලයකු කරා ළඟා කරවීම.
* පුස්තකාල සේවාවලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවබෝධය ලබාදීම.
* තොරතුරු ගවේෂණය කිරීමේ හැකියාවක් ලබා දීම.
* දැනුම සහ හැකියාවන් දියුණු කිරීමට අනුබල දීම.
* පාඨකයින් හා පුස්තකාල කාර්ය මණ්ඩලය අතර සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම

## පාඨක අධ්‍යාපන අන්තර්ගතය

පාඨක අධ්‍යාපනය මගින් පහත සඳහන් කරුණු පිළිබඳ පාඨකයාට පරිපූර්ණ අවබෝධයක් ලබා දෙනු ලැබේ.

* පුස්තකාලයෙහි අරමුණු, නීතිරීති, චර්යාධර්ම, කාර්ය මණ්ඩලය පිළිබඳ හැඳින්වීම
* පුස්තකාලයෙහි සැලැස්ම සහ විවිධ අංශ පුස්තකාලයෙන් ඉටු කරන සේවාවන්
* පුස්තකාලයෙහි ඇති සම්පත් වන පොත්, සඟරා හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්.
* පුස්තකාල මූලාශ්‍රයන් වන ප්‍රධාන ශ්‍රව්‍ය සහ දෘශ්‍ය අනුක්‍රමණිකාව
* ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍රයන් වන ග්‍රන්ථ නාමාවලී, අනුක්‍රමණිකා, ප්‍රවීණ ලේඛන සහ කියවීම් ලැයිස්තු
* වර්ගීකරණ ක්‍රමය සහ සූචිකරණ ක්‍රමය
* පුස්තකාල සම්පත සංවිධානය කර ඇති අන්දම
* පුස්තකාල සම්පත්වල ප්‍රධාන ලක්ෂණ සහ ප්‍රයෝජන ගන්නා අන්දම.

## අනුස්ථාපනය සහ උපදේශක සේවා

පාඨක අධ්‍යාපනය ප්‍රධාන ක්‍රම දෙකකින් ලබාදෙනු ලැබේ.

1. පාඨක අනුස්ථාපනය (Library Orientation) පාඨක අනුස්ථාපන සේවාවෙන් බලාපොරොත්තු වනුයේ අදාළ පුස්තකාලයේ සාමාන්‍ය සැකැස්ම, විවිධ අංශ, විවිධ සේවා සහ කාර්ය මණ්ඩලය පිළිබඳ පාඨකයින්ට හැඳින්වීමක් කිරීමයි.
2. ග්‍රන්ථ විද්‍යාත්මක උපදේශක සේවා (Bibliographic instruction): ග්‍රන්ථ විද්‍යාත්මක උපදේශක සේවාවන්හි අරමුණ වනුයේ අදාළ පුස්තකාලයෙන් විවිධ විෂය ක්ෂේත්‍රයන්ට සම්බන්ධව ලබාගත හැකි තොරතුරු සහ ඒවා ප්‍රයෝජනයට ගන්නා අයුරු පිළිබඳව පාඨකයින්ට දැනුවත් කිරීමයි.

පාඨක අධ්‍යාපනය අනුස්ථාපන සේවාවක් හී හා උපදේශක සේවාවක් හී සම්බන්ධතාවයක් තිබුණු අඛණ්ඩ ක්‍රියාවලියකි. පාඨක අධ්‍යාපන ක්‍රම ඒ ඒ පුස්තකාලයෙන් විසින් සැලසුම් කර ඇත්තේ මෙම ක්‍රම දෙකෙහි සංකලනයකි. නවක පාඨකයින් සඳහා පළමුවෙන් ම ඔවුන් ඇතුළත් පුස්තකාලය හැඳින්වීම වන අතර ග්‍රන්ථ විද්‍යාත්මක උපදේශක සේවා සුදුසු වන්නේ දෙවනුවයි.

## පාඨක අධ්‍යාපන ක්‍රම

පාඨක අධ්‍යාපනය සඳහා විවිධ පුස්තකාල විවිධාකාර ක්‍රම උපයෝගී කරගනු ලැබේ. එක ක්‍රමයක් මගින් පමණක් පාඨක අධ්‍යාපන කාර්යාවලිය කිරීමට නොහැකි වන අතර, සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැක්කේ පහත සඳහන් ක්‍රම අනුගමනය කිරීමෙනි.

## දේශන (Lectures)

පාඨක අධ්‍යාපනය ලබා දීමේ දී ප්‍රධාන ප්‍රචලිත ක්‍රමය දේශන පැවැත්වීමයි. එය පාඨකයන් විශාල පිරිසකට එකවර කරුණු කියාදීමේ පහසුම ක්‍රමය යි. පුස්තකාලයක සාමාජිකත්වය ලබූ විගසනුවම්ම දේශන මගින් පාඨකයා පුහුණු කළ යුතුය. පුස්තකාල චාරිකා අවසානයේ දී ද දේශන පවත්වනු ලැබේ. දේශන සාර්ථක වුවත් විවිධ මාධ්‍යයන් අනුගත දේශන මගින් ලැබෙන ප්‍රතිඵල ඉතා අඩු බව පර්යේෂණ අනුව පෙනී ගොස් ඇත.

## සම්මන්ත්‍රණ හා වැඩමුළු (Seminars and workshops)

සම්මන්ත්‍රණ හා වැඩමුළු මගින් පුස්තකාල සම්පත් ඒවා පරිහරණය කිරීම හා අවශ්‍ය තොරතුරු සොයා ගන්නා ආකාරය පිළිබඳ අවබෝධයක් පාඨකයින්ට ලබා දිය හැකිය. පාඨකයන් පස් හය දෙනා දක්වා වන සංඛ්‍යාවක් සඳහා මෙම ක්‍රම භාවිතා කරනු ලබයි. සමහර රටවල විශ්වවිද්‍යාලවල ආචාර්යවරුන්ට පාඨක අධ්‍යාපනය ලබා දීම සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු යොදා ගනු ලැබේ.

පාඨකයන් හා පුස්තකාල කාර්ය මණ්ඩලය අතර සම්බන්ධීකරණය සම්මන්ත්‍රණ හා වැඩමුළු මගින් ඇති වේ. එසේ වුවද මේ සඳහා කාර්ය මණ්ඩල වැඩිපුර අවශ්‍ය වීම අවාසිදායක කරුණකි. විශේෂ විෂයන් පිළිබඳ ප්‍රගත විද්‍යාත්මක උපදේශන සේවා සැපයීම සඳහා විෂය පිළිබඳ විශේෂඥයින්ගේ ද විශ්වවිද්‍යාලයක නම් ආචාර්ය මණ්ඩලයේ ද උපකාරය ලබා ගත හැකිය.

## පුස්තකාල චාරිකා (Library tours)

පුස්තකාල චාරිකා සඳහාවන අලුතෙන් බැඳෙන්නන් පුස්තකාලය සහ එහි කටයුතු පිළිබඳ දැනුමක් ලබා දීමයි. මෙම චාරිකාව පාඨකයන් හෝ පාඨක කණ්ඩායම් වශයෙන් සංවිධානය කළ හැකිය. පුස්තකාල චාරිකාවේ මූලික අරමුණ නවක පාඨකයන්ට පුස්තකාලයේ සම්පත්, විවිධ අංශ, සේවාවන, පුස්තකාල මූලාශ්‍ර සහ කාර්ය මණ්ඩල පිළිබඳ අවබෝධයක් ලබා දීමයි. මෙය කෙටි චාරිකාවක් වන අතර විශ්වවිද්‍යාල පුස්තකාලයන් හි නම් අධ්‍යයන වර්ෂය ආරම්භයේ දී කරනු ලැබේ.

මෑත යුගයේ දී සමහර රටවල පුස්තකාල මෙම චාරිකා සම්ප්‍රදායෙහි අත්හැර දමා ඇත. ඒ වෙනුවට මුද්‍රිත පත්‍රිකා (printed leaflet) සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් (audio visual media) උපයෝගී කරගෙන තමන්ම පාඨකයාට යා හැකි ස්වයං නියමු චාරිකා (self guided tours) හඳුන්වා දී ඇත. මේ මාර්ගයෙන් පහසුවෙන් නවක පාඨකයන්ට තමන්ට විවේකය තිබෙන අවස්ථාවක දී අවශ්‍ය තොරතුරු හා සේවා ලබා ගැනීමේ හැකියාව ලැබේ.

## ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් (Audio visual media)

ශ්‍රවණය හෝ දර්ශනය සඳහා උපකරණ සමග භාවිත කරන ශ්‍රව්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෑත කාලයේ දී පාඨක අධ්‍යාපනය සඳහා ලැබෙන විශේෂ වැඩි සැලකිල්ලත් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ආශ්‍රයෙන් මාධ්‍යයන්ට වැඩි භාවිත කිරීමට පෙළඹී ඇත. ඒ සඳහා පහත සඳහන් මාධ්‍යයන් උපයෝගී කරගනු ලැබේ.

## (Tape slide)

පුස්තකාලයේ ඡායාරූපගත කරන ලද චිත්‍ර කාච සහ ඒවාට අදාළ විස්තර පටිගත කර ඇති ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් හා කැසට් පරිශීලකයක් මගින් පාඨකයෙකුට හෝ කණ්ඩායමකට දැනුමක් ලබා දීම මෙහිදී සිදු කරනු ලැබේ. දේශන හෝ සම්මන්ත්‍රණ සඳහා ආධාරකයක් වශයෙන් ද යොදා ගනී. තනි පාඨකයෙකු හෝ කණ්ඩායමක් සඳහා දැනුම ලබා දීමට මෙම මාධ්‍ය උපයෝගී කරගත හැකිය. දේශකයෙකුගේ හෝ පුස්තකාල කාර්ය මණ්ඩලයේ ආධාරයකින් තොරව මෙය භාවිත කළ හැකිය. තමන්ට අවශ්‍ය විස්තර පමණක් වුව ද ලබා ගත හැකිය. මෙහි සංශෝධනය කිරීම ද කළ හැකිය. තවත් වාසියක් ඒවායේ ගබඩා කිරීමට ද ඇති පහසුවයි.

## චිත්‍රපට (Film)

මෙය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය අතුරින් අධ්‍යාපනික තොරතුරු සැපයීමේ මාධ්‍යය වශයෙන් පාඨකයන් සහ පුස්තකාලයාධිපතීන් අතර ප්‍රධාන ජනප්‍රිය වී ඇත. රූප, ශබ්ද, චලන, වර්ණ ආදිය මගින් සිත ආකර්ෂණය කරන අංග සියල්ල එකවර වීම මෙයට හේතු වී ඇත. පුස්තකාල ප්‍රවිෂ්ට සහ සේවාවන් ප්‍රධාන විශේෂතා ආකාරයට ඉදිරිපත් කළ හැකි වීම නිසා අවබෝධ කර ගැනීමට පහසු වීම විශේෂ ලක්ෂණයකි.

## වීඩියෝ කැසට් පට (Video cassettes)

වීඩියෝ කැසට් පට ද පාඨක අධ්‍යාපනයේ ජනප්‍රිය මාධ්‍යයකි. චිත්‍රපටවල මෙන්ම රූප, ශබ්ද, චලන, වර්ණ, යන ආකර්ෂණීය අංග වලින් යුක්තය. රූපවාහිනී යන්ත්‍රයක සිරස මත වීඩියෝ කැසට් යන්ත්‍රය සවිකර කරන ලද පද්ධතියක් වශයෙන් ක්‍රියාකාරීත්වය සරල වේ. ශ්‍රව්‍ය කැසට් යන්ත්‍රයක මෙන් තමන්ට අවශ්‍ය කොටස සොයා ගැනීමේ පහසුව පවතී.

## පරිගණක උපකාරක උපදේශන (Computer assisted instruction (CAI))

පරිගණක තාක්ෂණයේ සංවර්ධනයත් සමඟම එය පාඨක අධ්‍යාපනය සඳහා ද උපයෝගී කරගෙන ඇත. මේ පිළිබඳව විදේශයන්හි විශ්වවිද්‍යාල උපදෙස් දෙන වැඩ සටහන් සකස් කර ඇත. මේ ක්‍රමය පාඨක අධ්‍යාපනය සඳහා ප්‍රශස්ත උපකාරකයක් වශයෙන් වැදගත් වේ.

## මුද්‍රිත මාධ්‍ය (Printed media)

මුද්‍රිත මාධ්‍ය මගින් පුස්තකාල පිළිබඳ හැඳින්වීම ද එමගින් ම ප්‍රගත විද්‍යාත්මක උපදෙස් ද දිය හැක. පාඨකයන් හට තමන්ට අවශ්‍ය තොරතුරු හා උපදෙස් අවශ්‍ය අවස්ථාවල දී ලබාගැනීමේ පහසුව පවතියි. කලාතුරකින් පුස්තකාලය පරිහරණය කරන හෝ කාර්ය මණ්ඩලය වෙතින් ප්‍රශ්න ඇසීමට මැලිවන පාඨකයින් හට මෙය ඉතා ප්‍රයෝජනවත්ය.

මුද්‍රිත මාධ්‍යයන් සකස් කිරීම හා මුද්‍රණය විවිධය. නිෂ්පාදනයට සාපේක්ෂව පහසු මුද්‍රිත පාඨක අධ්‍යාපනය සඳහා ඉතා ප්‍රයෝජනවත් මාධ්‍යයක් වේ. පුස්තකාල අත්පොත් (library handbooks) සහ නියමු පොත් (guide books) මේ අතර වැදගත් වේ.

## පුස්තකාල අත්පොත් (Library handbooks)

අත්පොතක් යනු ඉතා පහසුවෙන් අතේ තබා ගත හැකි පරිදි කුඩාවට සකසන ලද පුස්තිකා විශයෙන් කෙටි ස්වරූපයෙන් ඉදිරිපත් කර ඇති කෘතියකි. පුස්තකාලය හැඳින්වීම සඳහා ප්‍රයෝජනවත් ආධාරකයකි.

### අත්පොතක අඩංගු විය යුතු කරුණු

- පුස්තකාලයේ නම හා ලිපිනය.
- සේවා කරන දිනයන්, වේලාවන් හා නිවාඩු දිනයන්.
- පුස්තකාලය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීම
- පුස්තකාලයේ පරමාර්ථ
- පුස්තකාලයේ සංවිධානය
- විශේෂ සේවා සහ විශේෂ එකතුව.
- පුස්තකාල සූචිය.
- පුස්තකාල වර්ගීකරණය.
- සාමාජිකත්වය හා අදාළ නීතිරීති

* පුස්තකාල කාර්ය මණ්ඩලය සහ සේවය කරන අංශ
* නීතිරීති සහ රූප සටහන්.
  දැනට පුස්තකාලය පිහිටි ස්ථානය.
  ගොඩනැගිල්ලේ සැලසුම.
  පොත් පද්ධතිය සැකසුම.
  වර්ගීකරණයේ මූලික කරුණු.

කුඩා පුස්තකාලයකට වඩා විශාල පුස්තකාලයක් භාවිත කරන පාඨකයාට අත්පොත විශාල ප්‍රයෝජනවත් මාධ්‍යයක් විය හැක. අත්පොත ආකර්ෂණීයත්වයෙන් යුක්ත විය යුතුය. සිත්ගන්නා වර්ණ සංයෝජනය කළ යුතුය. පටුනක් සහ අනුක්‍රමණිකාවක් තිබීම වැදගත් වේ. කෙටි ප්‍රකාශන පෙළඹවන ලෙසින් තිබිය යුතුය. අවශ්‍ය අවස්ථාවන්හි ඡායාරූප, සිතියම් හා චිත්‍ර මගින් කරුණු පැහැදිලි කළ හැකිය.

## නියමු පොත්
## (Guide books)

අත්පොතක තරම් විස්තර රහිතව නියමු පොත් ඇතුළත් කෙරේ. පසුව සඳහන් කරුණු සඳහා වෙන් වෙන් වශයෙන් නියමු පොත් සකසනු ලැබේ.

* පුස්තකාලය හැඳින්වීම.
* ඒ ඒ විෂයයන් පිළිබඳ ඇති මූලාශ්‍ර හා සම්පත්.
* ප්‍රධාන විද්‍යාත්මක මූලාශ්‍ර භාවිත කරන ආකාරය
* පුස්තකාලයෙන් ප්‍රයෝජනය ගන්නා ආකාරය ආදී වශයෙනි.

## ප්‍රායෝගික අභ්‍යාස
## (Practical exercise)

ප්‍රායෝගික අභ්‍යාසයෙහි මූලික පරමාර්ථ වනුයේ,

* මූලික තොරතුරු මූලාශ්‍ර වර්ගයන් හඳුන්වා දීම.
* මූලාශ්‍ර වර්ගයන් උපයෝගී කරගැනීමට පාඨකයාට හුරු කරවීම.
* කාර්යක්ෂම ලෙස සහ ප්‍රයෝජනවත් ලෙස එම මූලාශ්‍ර වර්ගයන් ප්‍රායෝගික අභ්‍යාස පදනම් කරගෙන පරිහරණය කිරීමට හුරු කරවීම.

දේශනයක් මගින් තොරතුරු මූලාශ්‍රයන් පිළිබඳ කියාදීමට වඩා ප්‍රායෝගික අභ්‍යාස මගින් පාඨකයාට ඒ පිළිබඳ අවබෝධයක් ලැබේ. පැවරුම් පොතක ආධාරයෙන් ප්‍රායෝගික අභ්‍යාස කළ යුතු වේ. මෙහිදී පාඨකයන් හට සම්පූර්ණ කිරීම සඳහා පැවරුම් නිශ්චිත ලෙස ඇතුළත් පැවරුම් පොතක් දෙනු ලැබේ. එසේනම පැවරුම්වල බලාපොරොත්තු වනුයේ පුස්තකාලයේ සම්පත් හා සේවා භාවිත කිරීමට ඔවුන් හුරු කර ගැනීමය. මෙම පැවරුම්වලදී භාවිත කළ යුතු මූලාශ්‍ර පිළිබඳ කෙටි කරුණු විස්තරයක් එක් එක් පැවරුමේ අවසානයේ වේ.

## සාකච්ඡා
## (Discussions)

පාඨක අධ්‍යාපනයේ විවිධ කරුණු අරභයා සාකච්ඡා පැවැත්වීම මගින් අදහස් ගනු ලැබේ. පාඨකයින් තමන් දැනගත් අතර මෙය කුඩා කණ්ඩායම් සඳහා යෝග්‍ය ක්‍රමයකි. මෙහි දී සෑම පාඨකයෙකුට ම තම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලැබෙන අතර ඔවුනොවුන් ප්‍රශ්න සාකච්ඡා කිරීමට ද අවස්ථාවක් සැලසේ.

## අත්දැකීම් හුවමාරු කරගැනීම
## ( Exchange of experience)

අත්දැකීම් හුවමාරු කරගැනීම සාකච්ඡාවක මෙන් ම කුඩා පිරිසකගේ සහභාගිත්වයෙන් කළ යුත්තකි. පුස්තකාල හා පුස්තකාල සම්පත් පරිහරණය කිරීමේ දී තමන් ලබා ගත් අත්දැකීම් හුවමාරු කරගැනීම මෙහි පරමාර්ථයයි.

## තොරතුරු පුවරු
## (Bulletin board)

තොරතුරු පුවරුවල පරමාර්ථය වනුයේ විවිධ කරුණු අරභයා තොරතුරු මේ පුවරු තුළ දැක්වීමයි. මූලික වශයෙන් පුස්තකාලය තුළ ද බාහිර ස්ථානවල ද තොරතුරු පුවරු තැබිය හැකිය. පුස්තකාලයට ඇතුළු වන ස්ථානයෙහි තොරතුරු පුවරු මගින් පුස්තකාලය විවෘතව තබන වේලාවන් සහ නිවාඩු දිනයන් පිළිබඳව තොරතුරු දිය හැක. ප්‍රධාන සූචිය අංශයන්හි වර්ගීකරණ ක්‍රමය, සූචි පද්ධති පිළියෙළ කර ඇති ආකාරය සහ පුස්තකාලයෙහි පොත් සකස් කර ඇති ආකාරය පිළිබඳ තොරතුරු දැක්වීමට පුළුවන. එසේ ම අලුත් පොත් හෝ පොත්වල පිටකවර පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීමට හැකි වේ. සඟරා අංශයෙහි ඇති තොරතුරු පුවරුවෙහි අලුත් සඟරා කලාප ප්‍රදර්ශනය කිරීමට පුළුවන. එසේම ලේඛකයන්ගේ ජීවිතාශ්‍රිත සිදුවීම්, ජාතික දිනයන් සහ විශේෂ අවස්ථාවන් ආදිය පිළිබඳව පොත් හා සඟරා ප්‍රදර්ශනය කිරීමට ද තොරතුරු පුවරු ආධාර කර ගත හැකිය.

## ප්‍රශ්නාවලි
## (Questionaries)

ප්‍රශ්නාවලි මගින් පාඨකයින්, පාඨක අවශ්‍යතා හා පුස්තකාල භාවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට පුළුවන. පාඨකයන් පුස්තකාලය භාවිත කිරීමට පැමිණ මාස කිහිපයකට පමණ පසු ප්‍රශ්නාවලියක් දීමෙන් ඔවුන්ගේ අවශ්‍යතා හා පුස්තකාලය භාවිත කර ඇති ආකාරය අනුව වැඩසටහන් තව දුරටත් පාඨක අධ්‍යාපනය දිය යුතු ද යන්න තීරණය කළ හැක.

## පාඨක අධ්‍යාපනය කරනු ලබන්නේ කවුරුන් විසින් ද ?

විශාල පුස්තකාලයක නම් පාඨක අධ්‍යාපන කාර්යයන් සඳහා වෙන ම තොරතුරු නිලධාරීන් හෝ උපදේශක නිලධාරීන් ඇත. අනෙකුත් පුස්තකාලයන් හි මෙම කාර්යය විධායක කාර්ය මණ්ඩලය විසින් කරනු ලැබේ. කුඩා පුස්තකාලයක නම් පුස්තකාලයාධිපති විසින් පාඨක අධ්‍යාපනය කරනු ලැබේ.

## පාඨක අධ්‍යාපනය කරනු ලබන අයට තිබිය යුතු සුදුසුකම්

පාඨක අධ්‍යාපනය කරනු ලබන අයට පුස්තකාල සම්පත්, පුස්තකාල සේවා සහ ඒවායින් උපරිම ප්‍රයෝජනය ලබාගන්නා ආකාරය පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුයි. මෙන්ම පුස්තකාල විෂයික ප්‍රශ්නයන් හා ගැටලු පැහැදිලි කිරීම අවශ්‍ය කරුණකි. එමෙන්ම පාඨකයින්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ උනන්දුව රඳවා ගැනීමට හැකියාව තිබිය යුතුයි.

## පාඨක අධ්‍යාපනය විධිමත්ව සිදු කිරීමට තිබිය යුතු අවශ්‍යතා

* ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටීම.
* පුහුණු කාර්ය මණ්ඩලයක් සිටීම
* දෛනික කාර්යයන් කිරීමට අමතරව පාඨක අධ්‍යාපනය සඳහා කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් කාලයක් තිබිය යුතු වීම.
* පාඨක අධ්‍යාපන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන තිබිය යුතු වීම.
* පුස්තකාල ආයතනයන් මෙන් ම තොරතුරු හා අධ්‍යාපන ආයතනයන්හි නිලධාරීන් හා සහයෝගයෙන් කටයුතු කිරීම.
* පාඨක අධ්‍යාපනය පිළිබඳ ජාතික, කලාපීය හා ජාත්‍යන්තර සම්මේලන හා වැඩමුළුවලට සහභාගී වීම
* විවිධ මට්ටම් පාඨකයින් සඳහා සුදුසු නව වැඩසටහන් සැකසීම

(14 පිටුවට)